# පුතේ ඔබේ ජීවිතය ගලවා ගැනීම උදෙසා



**මීට** වසර 7 කට පෙර පිරිපුන් යොවුන් වියේ ඉතා නිරෝගී තරුණයෙකුව සිටි මගේ පුතු දිලංක හිටි අඩියේම අසනීප වූ බැවින් අපි ඔහුව ආරෝග්‍යශාලාව වෙත කැඳවා ගෙන ගියෙමු.

සවස් වනවිට උණු වැඩිවීම හා සිරුරේ කැක්කුම් වේදනා වැනි රෝග ලක්ෂණ වලින් පීඩා විඳිමින් දිනෙන් දින රෝගී තත්ත්වය උත්සන්න වෙමින් පවතින විට වෛද්‍යවරු ඔහුව විවිධ පරීක්ෂණ සඳහා යොමු කලෝය. කරන ලද පරීක්ෂණ වලින් පසුව නිගමනයකට එළැඹ වෛද්‍යවරුන් අපහට පවසා සිටියේ මාගේ පුතුට ලියුකේමියා ගණයට අයත් ලිඹ්පෝමා රෝගය වැළඳී ඇති බවයි. ප්‍රථම අදියර ලෙස කීමෝතෙරපි ප්‍රතිකාර කිරීම ඇරඹූ නමුදු එයින් සාර්ථක ප්‍රතිඵලයක් නොලත් තැන වෛද්‍ය මතය වුයේ ඇට මිඳුළු බද්ධ කිරීමකින් තොරව රෝගියාගේ ජීවිතය ගලවා ගත නොහැකි බවයි.

ඇටමිඳුළු බද්ධ කිරීම සඳහා රෝගියාගේ ලේ වලට සමාන ලේ වර්ගය ඇති කෙනෙකු සොයා ගැනීමේ දුෂ්කර කාර්යයේදී මුලින්ම ලේ පරීක්ෂණය සඳහා භාජනය විය යුත්තේ රෝගියාගේ ලේ හා බොහෝදුරට සමානකම් පැවතිය හැකි ලේ ඥාතීන් වන බැවින් දිලංක පුතුගේ සොහොයුරා හා කිට්ටුවර ලේ ඥාතීන් ලේ පරීක්ෂණයට භාජනය කරන ලදී. එහෙත් ඒ කිසිවෙකුගේ ඇටමිඳුළු දිලංකගේ ඇටමිඳුළු හා සැසඳුනේ නැත.

වෛද්‍යවරුන් පවසන්නේ ඇටමිඳුළු සංසන්දනය ඉතාම විරල කාර්යයක් බවත්, දහසකට එක් කෙනෙකුගේ ඇටමිඳුළු තවෙකෙකුට සමාන විය හැකි වුවද එයද එකම ජාන කොට්ඨාශයකට අයත් පිරිසකගෙන් පමණක් විය හැකි බවත්ය. එදා සිට ඔහුට ඇටමිඳුළු ලබාදීම සඳහා ගැලපෙන ලේ ඇති කෙනෙකු සොයා ඇටමිඳුළු ප්‍රදානය කිරීමට කැමති ඕස්ට්‍රේලියාවේ ලියා පදිංචි වී ඇති අයගේ ලේඛණය පරීක්ෂා කලද එයිනුදු කිසිවෙකුව සොයා ගැනීමට නොහැකි විය. හේතුව එහි ලියාපදිංචි ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පිරිස ඉතා අල්ප වූ බැවිනි.

එතැනින් නොනැවතී අපි විදෙස් රටවලට පවා ගොස් කෙනෙකු සොයා ගැනීමට උත්සාහ කළෙමු. ශ්‍රී ලංකාවටද ගොස් සොයා බැලුවෙමු.
ගුවන්විදුලිය, පුවත්පත් සහ සියලුම ජනමාධ්‍ය තුළින් ඇටමිඳුළු ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ජනතාව තුළ තිබූ බිය හා වැරදි ආකල්ප තුරන් කොට හරි අවබෝධය ලබාදීමට කටයුතු කළෙමු. මේ මහඟු කාර්යයට දායකවීමේ වැදගත්කම පෙන්වා දී මුල්ම ලේ පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතිය මෙල්බර්න් නුවර දී ආරම්භ කළෙමු.
සුමිර රත්නායක මහතාගේ සම්බන්ධීකරණයෙන් රතු කුරුස ලේ බැංකුවේ ආධාර යටතේ අපගේ පළමුවන ඇටමිඳුළු බද්ධ කිරීමේ අදාළ රුධිර පරීක්ෂණය බැන්ඩිනොන් ප්‍රජා ශාලාවේදී ශ්‍රී ලාංකිකයින් පමණක් සහභාගි කර ගනිමින් මුල්වරට 2001 නොවැම්බරයේදී පවත්වන්නට යෙදුණි. ඉන් අනතුරුව දෙවතාවක්ම බ්එරදඉැ ලේ බැංකුව හා යුරෝක්දහම් නිකේතනයේදී ලේ පරීක්ෂණ වාර දෙකක් පැවැත්වූ අතර, මේ සඳහා උනන්දුවක් දැක්වූ සෙසු පිරිස් කෙලින්ම ෆ්දමඑය ඊබන හි පිහිටි ඇටමිඳුළු බද්ධ කිරීමේ ලේඛණයේ ලියාපදිංචි විය.
දිලංකගේ ජීවිතය බේරා ගැනීම සඳහා කෙතරම් වෙර දැරුවද අපේ බලාපොරොත්තු සුණු කරමින් දවසින් දවසම රෝගීයාගේ තත්ත්වය නරක අතකට හැරෙමින් තිබුණි.

අවාසනාවක තරම මේ මාරාන්තික රෝගය හා පොරබැදි මාගේ ආදර පුතුට ඇටමිඳුළු ප්‍රදානය කිරීමට සුදුසු සෙකු සොයා ගැනීමට පෙර තුරුණු වියේදීම හේ අප අතරින් සදහටම වෙන්ව ගියේය.

දිලංක අහිමිවීම අපට මුළු ලොව අහිමි වුවා සේ හැඟුණි. කලක් යනතුරු ගත මෙන්ම සිතද වාරු නැතිවා සේය. අප්‍රාණික වූ අපේ දරුවාගේ ජීවිතය බේරා ගැනීම උදෙසා ඇරඹූ මේ ක්‍රියාවලිය අනාගතයේදී මේ භයානක රෝගයට ගොදුරු විය හැකි ඕනෑම කෙනෙකුගේ ජීවිතයක් බේරා ගැනීමේ පරමාර්ථය මුල් කොටගෙන යළි ප්‍රාණවත් කිරීමට අපි දැඩිව අදිටන් කර ගනිමු.
ඒ අනුව වික්ටෝරියා රජයේ සහයද ඇතිව මෙල්බර්න් හි බෞද්ධ සංගම් හා එකමුතුව දෙදහස් හතර වර්ෂයේ යළිත් ආරම්භ කලා පමණක් නොව දෙදහහස් හතර, පහ, හය යන කාල වකවානුව තුලදී ඇටමිඳුළු බද්ධ කිරීමට අවශය කරන ලේ පරීක්ෂණ ව්‍යාපෘති කිහිපයක්ම කරගෙන යෑමට අපට හැකිවුණි.

මෙල්බර්න් නුවර ආදි ශිෂ්‍ය සංගම්වල අතහිත සහ උනන්දුව මත යුරෝක් සහ ක්‍රිස්බරෝ පන්සල් වලදී බොක්ස්හිල්, ක්‍රේගිබර්න්, හැලම් යන ප්‍රදේශයන් හි ප්‍රජාශාලාවල මෙන්ම මෙල්බර්න් යුනිවසිටි ශාලාවේදීද පැවැත්වු ලේ පරීක්ෂණ ව්‍යාපෘති හේතුවෙන් සෑහෙන ශ්‍රී ලාංකිකයින් පිරිසක් ඇටමිඳුළු බද්ධ කිරීමේ ලේඛණයට ඇතුළත් කර ගැනීමට අපට අවස්ථාව සැලසුණි.
ආදරණීය පුතේ, ඔබ අපට අහිමි වූවද ඔබේ ජීවිතය ගලවා ගැනීම උදෙසා අපි ඇරඹූ මේ ව්‍යාපෘතිය තුළින් මේ මාරාන්තික රෝගයෙන් පීඩාවිඳින එක් වටිනා ජීවිතයක් හෝ බේරා ගැනීමට හැකිවේ නම් කෙතරම් භාග්‍යයක්ද?
අද අපේ උත්සාහයේ ප්‍රතිඵල අත් විඳීමට අවස්ථාවක් සැලසී තියනවා.
මෙහෙමයි, මා මේ කියන රෝගියා සිටියේ එංගලන්තයේ. මොහු බේරා ගැනීමට ඇටමිඳුළු ගැලපෙන කෙනෙකු සොයා ඕස්ට්‍රේලියාවේ ඇටමිඳුළු බද්ධ කිරීමේ, ලේඛණය පරීක්ෂා කිරීමේදී ඔවුන්ට ශ්‍රී ලාංකිකයෙකුගේ ඇටමිඳුළු ගැලපෙන බව සොයා ගත්තා. මේ තැනැත්තා ලේඛණයට ඇතුළුවුණේ ඔබටත් ඇටමිඳුළු ප්‍රදානය කිරීමේ බලාපොරොත්තුවෙනුයි. ඔබට නොගැලපුනත් එංගලන්තයේ ලියුකේමියා රෝගියෙකුට ඔහුගේ ඇටමිඳුළු ගැලපුනා. මේ තරුණ ළමයා මේ රෝගියාට ඇටමිඳුළු ප්‍රදානය කොට ඔහුගේ ජීවිතය බේරා දුන්නා. අද මේ රෝගියා ඉතාම නිරෝගීව ජීවත් වෙනවාලු.

ඇටමිඳුළු ප්‍රදානය කළ මේ ශ්‍රී ලාංකික තරුණයාත් ඉතාම නිරෝගීව හොඳින් ජීවත් වෙනවා. ඔහු ගැන තොරතුරු හෙළි කිරීමට අපට නීතියට අනුව ඉඩකඩ නැහැ. ඒත් අපේ උත්සාහය සාර්ථක වුණු එක කෙතරම් සතුටක්ද?
ඉතිං අපි මෙතරම් දීර්ඝ කාලයක් තිස්සේ කරගෙන ආ දේවල් ඉදිරියටත් නොනවත්වා කරගෙන යනවා. අසරණ ජීවිත බේරා ගැනීමේ පරම චේතනාව පෙරදැරි කරගෙන. ඒ වගේම මේ උදාර කටයුත්තට මෙතෙක් දායක වන්නට බැරිවුණු අවුරුදු 18-50 අතර වයස්වල සිටින ශ්‍රී ලාංකික පරිත්‍යාගශීලින් ගෙන් මම ආදරයෙන් ඉල්ලා සිටින්නේ ලේ පරීක්ෂණ ව්‍යාපාරයට අවුදින් ලේ බිඳක් ප්‍රදානය කොට ඇටමිඳුළු බද්ධ කිරීම සඳහා විවෘත කොට ඇති ලේඛණයට නම ඇතුළත් කර ගන්නා ලෙසය.
ඒ වගේම මා ඉතා ගෞරවයෙන් සිහිපත් කල යුතුයි අපිට ඉඩකඩ සලසා දුන් බෞද්ධ මධ්‍යස්ථානයවල ගරු ස්වාමීන් වහන්සේලාට ඇතුළු පුජකතුමන්ලාට සියලු මාධ්‍යවලට ඒ වගේම මේසා දිගුකලක් අප කරන ලද මේ ව්‍යාපාරයට නන් අයුරින් උපකාර කළ ශ්‍රී ලාංකික හා අනිකුත් ජාතීන්ට අයත් සියලුම පරිත්‍යාගශීලි ජනයාට මම ආදර ස්තුතිය පුද කරනවා.

ඇටමිඳුළු බද්ධ කිරීමේ ව්‍යාපෘතිය ගැන තව තොරතුරු දැන ගැනීමට අවශ්‍ය කෙනෙකු සිටි නම් අපට අමතන්න.

මම පර්ල් ඩයස්

ලක්ෂ්මන් හෝ පර්ල් ඩයස් - 94861752

සූරිය
SOORIYA
ශ්‍රී ලාංකික ඔබේ වෙළඳසල
22 Lorne Street Lalor Vic 3075
Tel 03 9402 5380 Melway 9B6

THE KINGDOM OF RAIGAM®
21 වන සියවසේ දේශීය සමාගම
www.raigam.lk
Sri Lanka
Raigam
රයිගම් නම් කවදත් කොතැනත්
හරිම රසයි!
දැන් අළුත් රස රැසක්!
Try New Fried & Devel Cuttle Fish Soy TVP and New String Hopper Flour
( now you don't have to use boiling or hot water to make string hopper mix/dough! ඇල් වතුරෙන් අනන්න!)
Raigam – Premium Quality Food Manufacturers from Sri Lanka.
Raigam – A trusted brand for taste and uncompromised quality.
Raigam Soy, Noodle Meal Kits, Vinegar, String Hopper Rice Flour, Dehydrated Vegetables, Coffee, Spices & Raigam Biscuits.
Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, Essendon, Victoria
Tel:03-9370 3813 Fax orders: 03-9337 9468
Email:sales@etechno.com.au July 2006

## සන්නස සාහිත්‍ය තරගාවලිය 2007

**නිර්මාණ බාරගන්නා අවසාන දිනය 2007 මැයි 31**

### වැදගත්

නිර්මාණ එවිය යුතු ලිපිනය පෙබරවාරි කලාපයේ සඳහන්ව තිබුණේ වැරැදියට ය. නිවැරැදි ලිපිනය පහත දැක්වෙයි. කරුණාකර ඔබේ නිර්මාණ පහත ලිපිනයට එවන්න. මෙයට පෙර වෙනත් ලිපිනයකට ඔබේ නිර්මාණ යොමු කළේ නම් කරුණාකර එහි පිටපතක් නැවත මෙම නිවැරදි ලිපිනයට එවා අපට සහය වන්න.

**විවෘත අංශය**
වයස් සීමාවකින් තොරව ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට විවෘත අංශයට සහභාගි විය හැකි ය.

**කෙටි කතා පොදු කොන්දේසි**
1 කෙටි කතා සඳහා වචන සීමාවක් නැත.
2 තමන්ට කැමති තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති නිර්මාණ සංඛ්‍යාවක් හැකි ය.
4 කෙටිකතාව තමාගේම නිර්මාණයක් බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් මග එවිය යුතුය.

**කාව්‍ය නිර්මාණ පොදු කොන්දේසි**
1 වචන සීමාවක් නැත
2 තමන්ගේ අභිමතය පරිදි සඳැස් හෝ නිසඳැස් නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති සංඛ්‍යාවක් නිර්මාණ ඉදිරිපත් කිරීමට අවසර ඇත.
4 නිර්මාණය තමන්ගේම බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමගම එවිය යුතුය.

**සියළුම අංශ සඳහා පොදු කොන්දේසි**
1 සෑම නිර්මාණයක්ම **පිටපත් තුනකින්** යුතුව එවිය යුතු ය.
2 තරගයට ඉදිරිපත් කරන නිර්මාණ මෙයට පෙර ප්‍රකාශිත ඒවා නොවිය යුතු ය.
3 තරගයට එවන නිර්මාණ නැවත ආපසු එවීමට හැකියාවක් නැති බව සළකන්න.
4 නිර්මාණ බාරගන්නා අවසාන දිනය
**2007 අප්‍රේල් 30** වෙයි.
5 තරගය පිළිබඳ මතුවන ගැටළු වලදී සන්නස සංස්කාරකගේ තීරණය අවසන් තීරණය බව සළකන්න. සන්නස වාර්ෂික සාහිත්‍ය තරගය 2007
**Sannasa 22 Lorne Street Lalor Vic 3075**